# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2478/45 - 2026 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVUD/LND/ACQUI/13/1-5
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: LD/05/2001/E/17.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:-*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1488 නැගෙනහිර සියඹලාගස්රුප්ප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාගස්රුප්ප ගමේ පිහිටි, ක.සි. 421356, කලාප අංක 02, පත්‍ර අංකය 2 දරන මූලික පිඹුරෙහි පහත සඳහන් බිම් කැබැල්ල.

**කැබලි අංක 01**
ඉඩමේ නම: විජේරත්නවත්ත, සියඹලාගහමුලවත්ත; හිමිකම් කියන්නා: සී/ස, උඩුබද්දාව විවිධ සේවා සමූපකාර සමිතිය; ප්‍රමාණය: හෙක්. 0.6056.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.04.28 වැනි දින පෙ.ව. 10.00 ට උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.04.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**නිලූකා ඩී දසනායක,**
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2026 පෙබරවාරි මස 23 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0051

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: YAK/LAN/01/46.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: J/71/L/1117/VE.

ගම් පුළුල් කිරීම සඳහා කොට්ටව මහේස්ලන්ඩ් වත්ත ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් 1974.09.27 දිනැති අංක 131 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි සඳහන් 7 වගන්තිය යටතේ දැක්වෙන දැන්වීමෙහි සඳහන් ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැවුංගල ග්‍රාම නිලධාරි වසමේ කොට්ටව ගමේ පිහිටි අ.ග.පි. 661හි අතිරේක අංක 04න් දැක්වෙන ඉඩම් වල බදු අයිතිය සම්බන්ධව විස්තර නිවැරදිව සඳහන් වන අතර හිමිකම් පරීක්ෂණ වර්ෂය දිනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2026.04.29 වැනි දින පූ.භා. 10.00 ට ගාල්ල යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2026.04.22 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**වී. ඒ. වී. ඩී. පී. රසාංජනී,**
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යක්කලමුල්ල.

2026 පෙබරවාරි මස 26 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0052

---

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: YAK/LAN/01/03/139.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: ජේ.73 එල්.1027 (වී.ඊ).

ගම් පුළුල් කිරීම සඳහා උල්හේන්කන්ද ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් 1978.04.07 දින අංක 312 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* සඳහන් 7 වගන්තිය යටතේ දැක්වෙන දැන්වීමෙහි සඳහන් ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තෙල්ලඹුර ග්‍රාම නිලධාරි වසමේ, තෙල්ලඹුර ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද අ.ග.පි. 637හි අතිරේක අංක 13න් දැක්වෙන, ඉඩම් සම්බන්ධව විස්තර නිවැරදිව සඳහන් වන අතර හිමිකම් පරීක්ෂණ වර්ෂය දිනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2026.04.29 වැනි දින පූ.භා. 10.00 ට ගාල්ල යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2026.04.22 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**වී. ඒ. වී. ඩී. පී. රසාංජනී,**
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යක්කලමුල්ල.

2026 පෙබරවාරි මස 26 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0053

---

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/KGK/4/2/(2)/01/04/11.
*කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2012/එච්ඩබ්/390/ඒ.

උක්ත ශීර්ෂ යටතේ 2017 ජනවාරි මස 04 වෙන දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2000/46 හා *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පලකරන ලද 7 වගන්තිය යටතේ දැන්වීමෙහි (460 වැනි පරිච්ඡේදයේ) සඳහන් මෙහි පහත I ඡේදයේ සඳහන් කොටස ඉවත් කොට ඒ වෙනුවට මෙහි II ඡේදයේ දැක්වෙන කොටස් ආදේශ කොට එම දැන්වීම සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

I ඡේදය
ඉවත් කළ යුතු කොටස

කැඩැස්තර සිතියම් අංක 320391 කලාප අංකය 6න් 4 වැනි කලාපය පත්‍ර අංකය 3 හි කැබලි අංක 198

ඉඩමේ නම: මෙනේරිකනතේහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මහනුවර, අම්පිටිය පාර, අංක 257 හි පදිංචි ස්වර්ණා සෙනවිරත්න; ප්‍රමාණය: හෙක්. 0.0007.

කැඩැස්තර සිතියම් අංක 320391 කලාප අංකය 6න් 4 වැනි කලාපය පත්‍ර අංකය 3 හි කැබලි අංක 199

ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0002.

II ඡේදය
ආදේශ කළ යුතු කොටස

කැඩැස්තර සිතියම් අංක 320391 හි කලාප 04 හි පත්‍ර අංක 7 හි;

1. **කැබලි අංක 01**
ඉඩමේ නම: මෙනේරිකනතේහේන; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මහනුවර, අම්පිටිය පාර, අංක 261 හි පදිංචි ඩී. ඒ. එරංගා නදීශානී පෙරේරා; ප්‍රමාණය: හෙක්. 0.0006.

2. **කැබලි අංක 02**
ඉඩමේ නම: මෙනේරිකනතේහේන; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0003.

**අමිල නවරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ.

2026 පෙබරවාරි මස 17වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0054

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.